

සිදුහත් කුමරු සිය ඥාති සමූහයා ඉදිරියේ ශිල්ප දැක්වූ අවස්තාව

### බුද්ධ ශාසනයේ පළමුවැනි භික්ෂුණිය මහා ප්‍රජාපතී ගෝතමී

– නෙම්සිරි මුතුකුමාර

සිදුහත් බෝසතුන් වහන්සේගේ සුළු මව වූද, බුදු සසුන බිහි වූ පසු මෙහෙණි සසුන ඇරැඹීමට මුල් වූද මහා ප්‍රජාපතී ගෝතමී චරිතයේ විශේෂත්වය විස්තර කැරෙන ලිපියකි. කාන්තාව සතුව පැවතිය යුතු යහපත් ගුණාංග පිළිබඳ ආදර්ශය සහ මෙහෙණි සසුනේ චිර පැවැත්මට හේතු වූ මහා ප්‍රජාපතී ගෝතමී දේවිය සතුව තිබූ සුවි–ශේෂ නායකත්ව ගුණාංග මෙම ලිපියෙන් විස්තර කැරේ.

### පෝදා නිරාවරණය කැරෙන ඇඹුල්ගම රජ මහ විහාරය

– කොරතොට විජේතුංග

පෝද නිරාවරණය කැරෙන ඇඹුල්ගම රජ මහ විහාරයේ බුද්ධ ප්‍රතිමාව
කොළඹ දිස්ත්‍රික්කයට අයත් හංවැල්ල ප්‍රදේශයේ පිහිටි ඓතිහාසික හා පුරා විද්‍යාත්මක වටිනාකමක් ඇති පැරැණි විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු.

### රෝගී වීමට හේතු සාධක හා රෝග වළක්වා ගැනීම බුදු නෙත දුටු සැටි

– තෙළගපාත ධර්මකීර්ති නාහිමි සටහන – රංජිත් අම්පිටි–යාවත්ත

යහපත් සෞඛ්‍යය රැකගැනීම පිළිබඳ බුදු වදනෙහි ඇතුළත් ඔවදන් හෙළිදරව් කර ගැනීමට කරන ලද උත්සාහයකි. රෝග ඇතිවීමට බලපාන හේතු සහ ඒවා වැළැක්වීමට ගත යුතු පියවර පිළිබඳ බුදු දහමෙන් ලැබෙන මඟ පෙන්වීම හඳුනා ගැනීමයි, මේ ලේඛකයාගේ ප්‍රයත්නය වන්නේ.

### නවීන විද්‍යාත්මක නියාම බෞද්ධ දර්ශනයට අනුකූලයි

– පිටිදූවේ සිරිධම්ම හිමි සාකච්ඡා කළේ බන්දුපාල ගුරුගේ
බුදු දහම හා නවීන විද්‍යාව අතර තුලනාත්මක අධ්‍යයනයකි. වර්ත–මානයේ ඉතා දියුණු මට්ටමකට පත් වී ඇති විදු දැනුමෙන් ප්‍රතික්–ෂේප නොවූ එකම ආගම ලෙස සැලකිය හැකි බුදු දහමේ ශ්‍රේෂ්ඨ දර්ශනික වටිනාකම – මෙම ලිපියෙන් විමසුමට ලක් කැරේ.

### භාවනාව හා ධර්ම ප්‍රතිරූපක

– මඩවල උපාලි හිමි

පුද්ගල විමුක්තිය මූලික අරමුණ කර ගත් භාවනා කර්මයේදී යෝගීන්ට අත් දැකීමට සිදු වන විවිධ – ව්‍යාජ ධර්ම ප්‍රතිරූපක පිළිබඳ විග්‍රහයකි. විදර්ශනා වඩන යෝගීන් විසින් විශේෂයෙන් දැනගත යුතු කරුණු කිහිපයක් පෙන්වා දීමට මෙම ලේඛකයා උත්සාහ දරා ඇති බව පෙනේ.

### සහජීවනයේ මඟ කියාපාන අඹකොටේ සුගත තපෝවනය

– කොරතොට විජේතුංග

මහනුවර සිට කුණ්ඩසාලේ පාරේ ගොස් – දිගන නගරයට ආසන්න නිලගම මංසන්ධියෙන් හැරී ගිය විට හමුවන අඹකොටේ නමැති ප්‍රදේශයේ පිහිටි ආරණ්‍ය සේනාසනයක් පිළිබඳ තොරතුරු.

### වතුරුවිල වන අරණේ දැනේ සිසිලස දහම් සරණේ

– සීසර් සුදුසිංහ

ගාල්ල දිස්ත්‍රික්කයට අයත් ඇල්පිටිය ප්‍රදේශයෙහි පිහිටි වනවාසී හිමිවරුන් සඳහා ම වෙන් වූ ආරණ්‍ය සේනාසනයක් පිළිබඳ තොර–තුරු මෙම ලිපියෙන් හෙළි කැරේ.

### භික්ෂුණී සංඝයා හා අෂ්ට ගරු ධර්ම

– තලල්ලේ චන්දකිත්තිහිමි
බුදු සසුනේ පැවැත්මට හා ව්‍යාප්තියට සිදු වන බලපෑම් සැලකිල්ලට ගෙන මෙහෙණි සසුන ඇරැඹීමේදී ඉදිරිපත් වූ අෂ්ට ගරු ධර්ම නම් වූ සුවිශේෂ විනය නීති මාලාව පිළිබඳ විමසුමකි.

### කුට්ටිකණ්ණසෝණ මහ රහතන් වහන්සේ

– මාදම්පේ සරණතිස්ස නාහිමි
අසූ මහ ශ්‍රාවක චරිත විශේෂාංගය යටතේ පළ වන, දහ නව වැනි ලිපිය ‘කල්‍යාණ වාක්කරණ’ ඇත්තා වූ භික්ෂූන් අතරින් අග තැන් ලද – බුදුරදුන්ගේ ප්‍රධාන ශ්‍රාවකයන්ගෙන් එක් අයකු පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපියකි.

### විනයධර භික්ෂුණීන් අතර අග තැන් ලත් පටාචාරා රහත් මෙහෙණින් වහන්සේ

– ආචාර්ය සිරිපාල මාදුවගේ
නෑ හිතවතුන් රැසක් අහිමි වී සිත් කලකිරීමට පත්ව – පසුව බුදු සසුනෙහි පැවිදිව – බුදුරදුන්ගේ මුල් පෙළේ ශ්‍රාවිකාවක වූ භික්–ෂුණියකගේ චරිත කතාව.

### සතර කරුණකින් සසුන රැක ගැනීම

– කොටුගොඩ ධම්මාවාස අනු නාහිමි
බුදු සසුන පිරිහීමට හේතු කවරේද”යි බුදුරදුන්ගෙන් – සැරියුත් මහ රහතන් වහන්සේ විසින් විමසන ලදුව – බුදුරදුන් ඊට පිළිතුරු වශයෙන් දේශනා කළ හේතු හතරක් පිළිබඳ විමර්ශනයකි.

### Buddhist concept of the bond of craving

*-by Ven.Boralesgamuwe **Pemaratana** London Buddhist Vihara*

### මාරයාගෙන් බේරීමට මඟ

– දිවියාගහ යසස්සි නාහිමි
මරණය සහිත, දුක් සහිත සසර ගමන නතර කිරීමට; එම ගමනට හේතු වී ඇති කෙලෙස් මාරයන්ගෙන් ගැලවීමට අවශ්‍ය වන පිළි–වෙත් කිහිපයක් පිළිබඳ බුද්ධ දේශනාවකට අර්ථකථනයකි. එම පිළිවෙත් නිවන් සැපත අපේක්ෂා කරන අය දැන සිටිය යුතු වැද–ගත් පිළිවෙත් බවයි, ලේඛකයා පවසන්නේ.

### ‘බුද්ධං සරණං ගච්ඡාමි’

– වේපතඉර බෝධික හිමි
බුදුරජාණන් වහන්සේගේ සුවිශේෂ ශාස්තෘත්වය සහ ගුණ මහත්–වය පිළිබඳ විමසුමකි. බුදුරදුන් තුළ තිබූ මහා කාරුණික ගුණය, ප්‍රඥව හා කුසලතා සමූහය පිළිබඳ පාඨකයා දැනුවත් කිරීම, මේ ලේඛකයාගේ අරමුණ වී ඇති බව පෙනේ.

### ප්‍රඥාවෙන් අවබෝධ කර ගත යුතු ආර්ය අෂ්ඨාංගික මාර්ගය

– අත්තුඩාවේ සිරි රාහුල මහ නාහිමි
බුදුසමයෙහි විමුක්ති පිළිවෙත ප්‍රායෝගිකත්වයට නංවන හේතු සාධක විග්‍රහ කිරීමට කරන උත්සාහයකි. නුවණින් ධර්මය නිසි ලෙස අවබෝධ කරගැනීම – විමුක්ති මග ක්‍රියාත්මක වීම සඳහා බලපාන ප්‍රමුඛ හා ප්‍රාථමික අවශ්‍යතාව බව පෙන්වා දීමටයි, ලේඛ–කයා වැයම් කරන්නේ.

### සදාචාරාත්මක නොවන ආගමික ව්‍යාපාර ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි

– ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කරයි
ශ්‍රී ලංකාව තුළ දැනට සිදු වෙමින් පවතින බව පැවසෙන වෙනත් විවිධ ආගමික ප්‍රචාරක ක්‍රම වල සාවද්‍යතාව පිළිබඳ ක්‍රියාත්මක කළ හැක නීතිමය පසුබිම විග්‍රහ කැරෙන නව අධිකරණ තීන්දුවක් පිළිබඳ ප්‍රවෘත්තියකි.